**තේ ශක්ති අරමුදලේ ගනුදෙනු පිළිබඳ විගණකාධිපති** වාර්තාව **- 2024**

---

තේ ශක්ති අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ අරමුදලේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍ය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

**2. විගණන නිරීක්ෂණ**

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් ඇතුළත් කරන ලද මුදල් රෙගුලාසි 877(2) ඇ සහ 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන, ගිණුම් වර්ෂය අවසන්වී මාස 02 ක් තුළ කාර්යසාධන වාර්තාවක්ද සමඟ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය අවසානය දක්වා වූ මූල්‍ය ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 වත්කම් හා වගකීම්වල පැවැත්ම**

අරමුදල විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2019 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම් ,බැරකම් , ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **අයිතමය** | **වටිනාකම (රු.)** |
|---|---|
| **වත්කම්** | |
| ජංගම නොවන වත්කම් | 384,704,486 |
| ජංගම වත්කම් | 345,453,906 |
| **මුළු වත්කම්** | **730,158,392** |
| ස්කන්ධය | 201,250,254 |

| | |
|---|---|
| **වගකීම්** | |
| ජංගම නොවන වගකීම් | 273,292,456 |
| ජංගම වගකීම් | 255,615,681 |
| **ස්කන්ධය හා මුළු වගකීම්** | **730,158,391** |
| මුළු ආදායම | 117,439,777 |
| මුළු වියදම | 52,365,324 |
| **ලාභය** | **65,074,453** |

## 2.3 අරමුදලේ ක්‍රියාකාරිත්වය

තේ ශක්ති අරමුදල සතුව කර්මාන්තශාලා 12ක්, මාවරල වත්ත හා හොරණ පොහොර ගබඩාව පැවති අතර ඒවායේ කළමනාකාරීත්වය පුද්ගලික පාර්ශවයන් වෙත බදු දී තිබුණි. 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අරමුදල අඛණ්ඩව අලාභ ලබමින් තිබුණු අතර අරමුදලේ ස්කන්ධ ප්‍රාග්ධනයද ක්‍රමයෙන් අඩු වෙමින් පැවැතුණි. ඒ අනුව 2012 වර්ෂයේ දී රු.මිලියන 124.058 ක් වූ ස්කන්ධ ප්‍රාග්ධනය 2015 වර්ෂයේ දී රු.මිලියන 111.65 ක සෘණ අගයක් බවට පත්ව තිබුණි. මෙම තත්ත්වයන් මත 2016 ජූලි 13 දිනැති අංක අමප 16/1224/726/015-I දරන අමාත්‍ය මණ්ඩල තීරණයෙන් තේ ශක්ති අරමුදලේ කටයුතු වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත පවරා අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි. එසේම 2023 අප්‍රේල් 18 දිනැති අංක අමප/23/0615/616/014 දරන "තේ ශක්ති අරමුදලෙහි කොටස් හිමියන් වෙතින් තේ ශක්ති අරමුදල වෙත කොටස් ආපසු මිලදී ගැනීම" යන මැයින් වූ අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව තේ ශක්ති අරමුදලේ කොටස් හිමියන් සඳහා කොටසක නාමික අගය වන රු.10 ක මුදල ආපසු ගෙවා අදාළ කොටස් හිමිකම තේ ශක්ති අරමුදල වෙත භාර ගැනීමට සහ ඒ සඳහා තේ ශක්ති අරමුදලේ උපයාගැනීම් පමණක් භාවිතා කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. 2024 වර්ෂය සඳහා අරමුදලේ ප්‍රගතිය පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | 2023 අප්‍රේල් 18 දිනැති අංක අමප/23/0615/616/014 දරන "තේ ශක්ති අරමුදලෙහි කොටස් හිමියන් වෙතින් තේ ශක්ති අරමුදල වෙත කොටස් ආපසු මිලදී ගැනීම" යන මැයින් වූ අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව 2024 දෙසැම්බර් 31 දිනට අරමුදල විසින් නැවත මිලදී ගන්නා ලද කොටස් වටිනාකම රු.22,615,890 ක් වී තිබුණි. ඒ අනුව අරමුදල සමාලෝචිත වර්ෂය අවසන් දිනට මිලදී නොගත් කොටස් වටිනාකම රු.183,398,260 ක් බව නිරීක්ෂණය විය. | තේ ශක්ති කොටස් නැවත මිලදී ගැනීම් පිළිබඳව දැනුවත් කිරීමේ පුවත්පත් දැන්වීම් පල කර ඇති අතර කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ තේ පරික්ෂක නිලධාරින් මගින් සහ සමස්ථ ලංකා කුඩා තේ වතු සංවර්ධන සමිති සංවිධානයේ සමිති මගින් තේ ශක්ති කොටස් හිමියන් මේ පිළිබඳව දැනුවත් කරන ලෙස එම ආයතන වෙත ලිඛිතව දැනුවත් කර ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අරමුදල විසින් කොටස් ආපසු මිලදී ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | තේ ශක්ති අරමුදලේ කර්මාන්තශාලා බදු දීම සම්බන්ධයෙන් එළඹ තිබූ ගිවිසුම් ප්‍රකාරව බදු දුන් මාවරලවත්ත,හොරණ පොහොර ගබඩාව සහ කම්හල් 12 කින් 2024 දෙසැම්බර් 31 දිනට බදු මුදල් නොගෙවා ඇති ප්‍රමාණය රු.137,753,918 ක් විය. | හිඟ බදු/කළමනාකරණ ගාස්තු පැවති රයිගම්කෝරලය, ගිලිමලේ, මාවරල, ගිලිමලේ, කොත්මලේ, වලහන්දුව, මහවැලි සහ මාවරල වත්ත නැවත තේ ශක්ති අරමුදල වෙත පවරා ගෙන පැවති හිඟ මුදල් අයකර ගැනිමට අවශ්‍යය නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙස දන්වා අදාල තොරතුරු නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. අනෙකුත් හිඟ බදු/කළමනාකරණ ගාස්තු පවත්නා කර්මාන්තශාලාවල බදු/කළමනාකරණ ගැණුම්කරුවන් පවතින හිඟ බදු/කළමනාකරණ මුදල් වාරික වශයෙන් ගෙවීමට එකගතාව දක්වා ඇත. | හිඟ කළමනාකරණ ගාස්තු අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2024 ඔක්තෝබර් 29 දිනැති අංක අමප/24/1984/716/002 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව හිඟ බදුකුලී හෝ කළමනාකරණ ගාස්තු මත සියයට 10 ක වාර්ෂික අනුපාතයක් යටතේ යළි ගණනය කර ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු බැවින්, 2024 දෙසැම්බර් 31 දිනට බදුකුලී හෝ කළමනාකරණ ගාස්තු නොගෙවීම මත ප්‍රමාද ගාස්තු වශයෙන් රු.61,040,440 ක් අයකර ගැනීමට පවතින බවද නිරීක්ෂණය විය. | පවතින ප්‍රමාද ගාස්තු ගෙවන ලෙස අනෙකුත් ක්‍රියාත්මක තත්ත්වයේ පවතින බදු / කළමනාකරණ ගිවිසුම්වල පාර්ශවකරුවන් වෙත ලිඛිතව දැනුවත් කර ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2017 අප්‍රේල් 24 දින පෞද්ගලික පාර්ශවයකට මාවරල වත්ත කළමනාකාරීත්වය වසර 10 ක කාලයක් සඳහා බදු පදනමට ලබා දී තිබුණු අතර එම බදු ගැණුම්කාර පක්ෂය වෙතින් නැවත නැවත 2023 අගෝස්තු 15 දින අරමුදල වෙත මාවරල වත්ත පවරාගැනීමට කටයුතු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් නැවත බදු දීම සිදුකර | මාවරල ඉඩමට අයත් පිඹුරු පතෙහි පැවති යම් ගැටළු මත මායිම් නිරවුල් කර ගැනිමේ කටයුතු යම් ප්‍රමාදයක් සිදුවි ඇති නමුත් මේ වන විට අදාල තත්වය නිරවුල් කොට ගෙන මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් ඉඩමේ මායිම් සලකුණු කිරිමට අවශ්‍ය කටයුතු මේ වන විට සුදානම් කර ඇති අතර මෙම ඉඩම සඳහා සියළු අනවසර ඇතුළුවීම එරෙහිව | මාවරල වත්ත ඉඩම මිණුම් කටයුතු සිදුකර මායිම් නිරවුල් කර බිම් කොටස වෙන් කිරීමට සහ අරමුදල විසින් ඵලදායි කාර්යයක යෙදවීම හෝ නව බදු ගැණුම්කරුවෙකු වෙත ප්‍රදානය කිරීමට |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණි. යථෝක්ත දේපලේ අක්කර 100 ක පමණ සීමාව තුළ සීමා මායිම් නිසියාකාරව මිනුම් කර බිම් කොටස වෙන්කර දී නොතිබීම හා ඒ හේතුවෙන් බාහිර පාර්ශවයන් විසින් භූමිය පරිහරණය කිරීමට යොමුවීම පිළිබඳව 2021 වර්ෂයේ නිකුත් කළ කම්හල් බදුදීම සම්බන්ධ විගණන විමසුමේදී අනාවරනය කර තිබුණද 2024 වර්ෂය අවසානය දක්වා මායිම් නිරවුල් කරගැනීමේ කටයුතු සිදුකර නොතිබුණි. | මාවරල පොලිසියේ පැමිණිලි ගොනුකර ඇත.මෙයට අමතරව ඉඩමට අදාළව කොටපොල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ කේවියට් තහනමක් ලබාගෙන ඇත. | නොපමාව කටයුතු කළ යුතුය. |
| (ඉ) | අරමුදල විසින් ක්‍රියාත්මක කරන හොරණ පොහොර ගබඩාව හා රයිගම් කෝරලය කම්හල පිහිටි ඉඩම්වල අයිතිය, දැනට අදාළ ප්‍රාදේශීය ලේකම් යටතේද ඇල්පිටිය, හිනිදුම, හා පස්සර යන කම්හල් පිහිටි ඉඩම්වල අයිතිය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව යටතේද පවතින නමුත් ඉඩම්වල අයිතිය අරමුදලට පවරා ගැනීමකින් තොරව ගොඩනැගිලි හා කර්මාන්තශාලා ඉදිකර තිබුණි . | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ලිඛිත අනුමැතිය මත අදාල කර්මාන්ත ශාලා ඉදිකර ඇත. ඒ අනුව අදාළ ඉඩම් තේ ශක්ති අරමුදල වෙත පවරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සිදුකරමින් පවතී. | කම්හල් පිහිටි ඉඩම්වල අයිතිය අරමුදල වෙත පවරා ගැනිම සඳහා කටයුතු කළ යුතුය. |
| (ඊ) | තේ ශක්ති අරමුදලට එරෙහිව බාහිර පාර්ශවයක් විසින් දිසා අධිකරණයේ එක් නඩුවක් ගොනුකර තිබුණු අතර තේ ශක්ති අරමුදල විසින් දිසා අධිකරණවල මුදල් අයකර ගැනීමේ නඩු 07 ක් ඇතුලු නඩු 10 ක් ගොනුකර තිබුණි. | එකඟවෙමි. | නඩු කටයුතු වලට යාමෙන් දැරීමට සිදුවන වියදම් අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) | තේ ශක්ති ඉඩම්වල මායිම් නිවැරදිව හඳුනාගෙන මිනුම් කර නොමැති අතර එම ඉඩම් අනවසර පදිංචිකරුවන් භුක්ති විඳීමෙන් ඒවා නිරවුල් කර ගැනීමට නීතිමය පියවර ගැනීමට සිදු වීම නිසා එය අරමුදලට අමතර වැය බරක් වී තිබුණි. | ඉදිරියේදී එවැනි තත්ත්වයන් ඇති නොවීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කරමින් පවතී. | තේ ශක්ති අරමුදල සතු දේපළ නිවැරදිව මිණුම් කර නිරවුල් කර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (ඌ) | වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය විසින් විගණනය වෙත | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මගින් | අරමුදල සතුව භෞතිකව නොමැති මෙම වාහන |

| | | |
|---|---|---|
| ඉදිරිපත් කරන ලද TSF/ACC/Audit–2024-Vol iv දරන ලිපිය මඟින්, තේ ශක්ති අරමුදල නමින් ලියාපදිංචි/ අරමුදල නමින් ලියාපදිංචි කර වෙනත් ආයතන විසින් නඩත්තු කරමින් ධාවනයේ යොදවා ගෙන ඇති වාහන නොමැති බව තහවුරු කර තිබුණ අතර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙතින් ලබා ගන්නා ලද තොරතුරු ප්‍රකාරව තේ ශක්ති අරමුදල නමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාහන 17 ක් ලියාපදිංචි කර තිබුණි. ඒ අනුව වාහන 17හි වර්තමාන හිමිකාරිත්වය පිළිබඳව විගණනයේදී මතභේදාත්මක තත්ත්වයක් නිරීක්ෂණය විය. | තොරතුරු ලබා ගෙන හා අරමුදලේ පවතින තොරතුරු අනුව ඉදිරියේදී කරුණු තහවුරු කරගැනිමට කටයුතු කරන බැව් වැඩි දුරටත් දන්වා සිටිමි. | සම්බන්ධයෙන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මගින් තොරතුරු ලබා ගෙන ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |